# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1708/1 - 2011 මැයි 30 වැනි සඳුදා - 2011.05.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන (සංශෝධිත) ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිය පනත**

3 (2) වැනි වගන්තිය යටතේ නිවේදනය

2008 අංක 14 දරන සංශෝධිත ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(2) වැනි උපවගන්තිය යටතේ, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රෝහණ රාජපක්ෂ වන මා විසින්, කර්මාන්ත හා වාණිජ කටයුතු විෂයයන් පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා -

1. සීමාසහිත ලංකා වානේ සංස්ථාව මගින් ඇමෙරිකානු ඩොලර් මිලියන අසූවක (80) ආයෝජනයක් සහිතව, අතිනූතන තාක්ෂණයෙන් යුත් නව්‍ය වානේ කර්මාන්ත ශාලාවක් පිහිටුවීම සහ දැනට අතුරුගිරිය පිහිටි කර්මාන්ත ශාලාවේ වානේ කම්බි සහ සෙසු මැඩි වානේ නිෂ්පාදිත නිෂ්පාදනය කිරීමට සහ එහි පටු කැපීම් පෙලක් පිහිටුවීමට ජී අයි පයිප්ප සහ බට නිෂ්පාදන, ගැල්වනයිස් කිරීමේ යන්ත්‍රයක්, කම්බි ඇදීම සහ කම්බි දැල් නිෂ්පාදන, කම්බි ඇණ නිෂ්පාදන යන්ත්‍රයක්, වාත්තු වැඩපොළක්, රෑලි තහඩු මෝලක්, වට්ටු වානේ පිරිසැකැස්ම ඒකකයක් ආදීවලින් සමන්විතව නවීකරණය කිරීම ඉහතකී පනතේ කාර්යය සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස මෙම ව්‍යාපෘතිය හඳුනාගනු ලබන අතර විදේශ විනිමය ඉතිරි කර ජාතික ආර්ථිකයට දායකත්වයක් ලබා දිය හැකි ආනයන ආදේශ කර්මාන්තයක් ලෙස සහ ඉතා වැදගත් ක්ෂේත්‍රයක ජාතික ආර්ථිකයට ජවයක් එකතු කළ හැකි මෙම ව්‍යාපෘතිය මගින් රටට ආර්ථික ප්‍රතිලාභ හිමිවනු ලැබේ ;

2. අදාළ අවබෝධතා ගිවිසුම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ ව්‍යාපෘති සමාගම විසින් ගිවිසගත් දිනය ඉහතකී ව්‍යාප්ත කිරීමේ ඒකකය ආරම්භ වන දිනය බවට ප්‍රකාශ කරනු ලැබේ ; සහ

3. ඉහත කී ව්‍යාපෘතියෙහි කාර්යය සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත (සංශෝධිත) ප්‍රකාරව මෙම නිවේදනයේ උපලේඛනයේ දක්වා ඇති නිදහස් කිරීම් මෙම ව්‍යාපෘති සමාගමට අදාළ වන බව නිශ්චිතව දක්වනු ලැබේ.

*උපලේඛනය*

(අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සහ එහි සංශෝධන :

බදු ගෙවිය යුතු ලාභය සමාගම උපයන පළමු වසර ආරම්භය සිට හෝ වාණිජමය කටයුතු ආරම්භ කිරීමෙන් වසර දෙකකට (02) පසු, දෙකින් එකක් වූ කලින් එළඹෙන කවර හෝ වසර සිට වසර දහයක (10) ආදායම් බදු පනත යටතේ බදු නිදහස්


1A - G 14565— 380 (2011/05)


*සැ. යු.- අති විශේෂ ගැසට් අංක 1707/01 කාණ්ඩය 1707/24 න් අවසන් වේ.*

කාල පරිච්ඡේදයකින්, අනතුරුව, වසර දහයක (10) බදු නිදහස් කාල පරිච්ඡේදයට ඉක්බිතිව එළඹෙන තවත් වසර පහක (05) කාල පරිච්ඡේදයකට සෑම තක්සේරු වසර සඳහාම එවැනි කාලය තුළ අදාළව බල පවතින බදු අනුපාතිකයට අනුව අඩකට සමාන අර්ධ නිදහසක් ලබා දෙනු ලැබේ. පැහැදිලි කිරීමක් වශයෙන්, ඉහත විදහා පෙන්වා දී තිබෙන වසර පහළොව (15) ඉකුත්වීමෙන් පසුව එකල් බල පවතින සාමාන්‍ය බදු රාමුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සමාගම කෙරෙහි අදාළ වනු ඇත.

කෙසේවෙතත්, 2006 අංක 13 දරන ආර්ථික සේවා පනත යටතේ 0.25% ක ආර්ථික සේවා අයකිරීමක් අදාළ වනු ඇත.

(ආ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සහ එහි සංශෝධන :
ව්‍යාපෘති සමාගම සහ ආයෝජන මණ්ඩලය අතර මේ සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුම ගිවිසගත් දිනය සිට මණ්ඩලයේ අනුමැතිය ඇතිව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වසර පහක (05) කාල පරිච්ඡේදයක් තුළ ව්‍යාපෘතියට අදාළ ප්‍රාග්ධන භාණ්ඩ හා ඉදිකිරීම් අයිතමයන් මත එකතු කළ අගය මත බදු ගෙවීමෙන් නිදහස් කරනු ලැබේ.

(ඇ) 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන අයකිරීම් පනත :
ව්‍යාපෘති සමාගම සහ ආයෝජන මණ්ඩලය අතර මේ සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුම ගිවිසගත් දිනය සිට මණ්ඩලයේ අනුමැතිය ඇතිව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වසර පහක (05) කාල පරිච්ඡේදයක් තුළ ව්‍යාපෘතියට අදාළ ප්‍රාග්ධන භාණ්ඩ හා ඉදිකිරීම් අයිතමයන් මත වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන අයකිරීම් ගෙවීමෙන් නිදහස ලබා දෙනු ලැබේ.

(ඈ) 2011 අංක 10 දරන ජාතිය ගොඩනැංවීමේ බදු පනත :
ව්‍යාපෘති සමාගම සහ ආයෝජන මණ්ඩලය අතර මේ සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුම ගිවිසගත් දිනය සිට මණ්ඩලයේ අනුමැතිය ඇතිව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වසර පහක (05) කාල පරිච්ඡේදයක් තුළ ව්‍යාපෘතියට අදාළ ප්‍රාග්ධන භාණ්ඩ හා ඉදිකිරීම් අයිතමයන් මත ජාතිය ගොඩනැංවීමේ බදු ගෙවීමෙන් නිදහස ලබා දෙනු ලැබේ.

(ඉ) (235 වැනි අධිකාරිය වූ) රේගු ආඥාපනත :
සෘණ ලැයිස්තුවේ සඳහන් භාණ්ඩ හැරුණුවිට ව්‍යාපෘතියට අදාළව ආනයනය කරනු ලබන ප්‍රාග්ධන භාණ්ඩ සහ ඉදිකිරීම් අයිතමයන්වලට රේගු බදු අයකිරීම්වලින් නිදහස් කිරීම් අදාළ වේ. කෙසේවෙතත්, දේශීය වෙළඳපලේ එවැනි භාණ්ඩ අවශ්‍ය ප්‍රමාණයෙන් නොලැබෙන විට ව්‍යාපෘති සමාගම සහ ආයෝජන මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුම ගිවිසගත් දිනය සිට මණ්ඩලයේ අනුමැතිය ඇතිව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වසර පහක (05) කාල පරිච්ඡේදයක් තුළ සෘණ ලැයිස්තුවේ සඳහන් අයිතම සැලකිල්ලට ගනු ලබනු ඇත.

(ඊ) අමුද්‍රව්‍ය ආනයනය කිරීම :
ඉහතකී කම්හල් සඳහා ආනයනය කෙරෙන අමුද්‍රව්‍ය මත වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන අයකිරීම් අදාළ නොවන අතර මණ්ඩලයේ අනුමැතිය ඇතිව අලුත් මැඩි වානේ මෝල වාණිජමය කටයුතු ආරම්භ කිරීමට මාස හයකට ප්‍රථමයෙන් හෝ අලුත් මැඩි වානේ මෝල සඳහා ආනයනයන් සිදු කරන ලද පළමු දිනය දෙකින් පසුව එළඹෙන දිනය සිට වසර අටක (08) කාල පරිච්ඡේදයකට ඇත්නම් රේගු ආනයනය බද්දෙන් නිදහස ලබා දෙනු ලැබේ.

බැසිල් රෝහණ රාජපක්ෂ, පා.ම,
ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2011ක් වූ මැයි මස 30 වැනි දින,
කොළඹ දී ය.

06-219

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.